චක්‍රලේඛ අංකය: PS/DASA/Circular/5/2025

2025 ජූලි මස     වන දින

දිස්ත්‍රික් ලේකම්/ දිසාපති - අනුරාධපුර, පුත්තලම, පොළොන්නරුව, අම්පාර, හම්බන්තොට, මොණරාගල, කුරුණෑගල, බදුල්ල, මාතලේ, මඩකලපුව, ත්‍රිකුණාමලය, මන්නාරම, කිලිනොච්චි, වව්නියාව, මුලතිව්
අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
පොලිස්පති, ශ්‍රී ලංකා පොලීසිය
අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය
සභාපති, ලංකා විදුලිබල මණ්ඩලය

## අලි-මිනිස් ගැටුම් කළමනාකරණය සඳහා දිස්ත්‍රික් මට්ටමේ කමිටු පිහිටුවීම

නියාමනය නොකළ සංවර්ධන ව්‍යාපෘති, වන අලින්ගේ ගමන් මාර්ග සහ වාසස්ථාන විනාශය සහ අකාර්යක්ෂම අතීත මැදිහත්වීම් හේතුවෙන් ශ්‍රී ලංකාව පුරා උග්‍රවන අලි-මිනිස් ගැටුම, එම අර්බුදය විසඳීම සඳහා කඩිනම් සහ මනාව සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාමාර්ගවල වැදගත්කම බෙහෙවින් අවධාරණය කරයි. රටේ පරිසර පද්ධතිය, ජෛව විවිධත්වය සහ සංචාරක කර්මාන්තය පවත්වාගෙන යාම සඳහා, වන අලි සංරක්ෂණයේ වැදගත් කාර්යභාරය හඳුනාගනිමින්, බහු-ආංශික ප්‍රවේශයක් හරහා මෙම අර්බුදයට විසඳුම් සෙවීම වෙනුවෙන් වඩාත් අවදානමට ලක්විය හැකි කලාප සහ දිස්ත්‍රික්කයන් ඉලක්ක කර ගනිමින් **දිස්ත්‍රික් මට්ටමේ අලි-මිනිස් ගැටුම් කළමනාකරණ කමිටු** පිහිටුවීමට 2025.06.20 වන දින ජනාධිපති කාර්යාලයේ දී අදාළ විෂයට සම්බන්ධ නිළධාරීන් සහ විද්වත් පාර්ශ්ව සමඟ පැවති සාකච්ඡාවේ දී, ගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

2. ග්‍රාමීය ජීවනෝපායට සහ ජාතික ආර්ථිකයට දැඩි ලෙස බලපානු ලබන, අඛණ්ඩව තීව්‍ර වන මෙම වන අලි ගැටළුව විසඳීම සඳහා ක්ෂණික හා විධිමත් ප්‍රජා-ප්‍රතිචාරාත්මක සහ ප්‍රතිඵල-නැඹුරු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම මෙන්ම අලි-මිනිස් ගැටුම පාලනය කිරීමේ වගකීම පැවරෙන පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ රජයේ ආයතන මුහුණදෙනු ලබන කාර්යමණ්ඩල හිඟය, අවම ප්‍රවාහන පහසුකම්, තාක්ෂණික උපකරණ ප්‍රමාණවත් නොවීම, විශේෂයෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

මුහුණදෙනු ලබන අනෙකුත් මෙහෙයුම් සහ පරිපාලන අභියෝග සඳහා දිස්ත්‍රික් මට්ටමින් කඩිනම් විසදුම් ලබාදීම සහ ඒ ඒ දිස්ත්‍රික්කයට ආවේණික අලි-මිනිස් ගැටුම් කළමනාකරණ සහ විසඳුම් හඳුනාගැනීම ඉහත දිස්ත්‍රික් කළමනාකරණ කමිටු පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වේ.

3. ඒ අනුව,

3.1 හඳුනාගත් ප්‍රමුඛතා දිස්ත්‍රික්කයට (අනුරාධපුර, පුත්තලම, පොළොන්නරුව, අම්පාර, හම්බන්තොට, මොණරාගල, කුරුණෑගල, බදුල්ල, මාතලේ, මඩකලපුව, ත්‍රිකුණාමලය, මන්නාරම, කිලිනොච්චි, වව්නියාව සහ මුලතිව්) අදාළව, අලි-මිනිස් ගැටුම් කළමනාකරණය සහ ස්ථිර විසඳුම් ලබාදීම සඳහා විද්‍යාත්මක දැනුම හා දායකත්වය සහිත වගකිවයුතු නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් 2025.07.31 වන දිනට පෙර ස්ථාපිත කළ යුතුය.

3.2 ඒ සඳහා පහත ආයතනයන්හි නිලධාරීන් මෙන්ම දිස්ත්‍රික්කයට සුවිශේෂී වූ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයන්හි නිලධාරීන් ද ඇතුළත් කර ගත හැක.

i. දිස්ත්‍රික් ලේකම් (සභාපති)
ii. දිස්ත්‍රික් වන නිලධාරී
iii. දිස්ත්‍රික්කය භාර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ
iv. දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ
vi. දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්
vii. නියෝජ්‍ය පොලිස්පති හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
viii. දිස්ත්‍රික් සිවිල් ආරක්ෂක බලකා ප්‍රධානි
ix. මහවැලි කලාප කළමනාකරු
x. දිස්ත්‍රික් විදුලි අධිකාරී
xi. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ
xii. බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්(වරුන්)
xiii. ප්‍රාදේශීය සභා සභාපති(වරුන්)
xiv. හමුදා නියෝජිත (අවශ්‍ය නම්)
xv. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති විසින් නම්කරනු ලබන මහජන නියෝජිතයින් (4දෙනෙකු හෝ 5දෙනෙකු)
xvi. අදාළ පළාත් සභාවේ විෂය භාර ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු
xvii. දිස්ත්‍රික්කය අයත් වන අදාළ පළාත් පාලන ආයතනයන්හි නිළධාරීන්
xviii. සංරක්ෂණය සඳහා සම්බන්ධ වන ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන /රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින්
xix. වෙනත් විද්වත් සාමාජිකයින්

4. මෙම කමිටුව විසින්, බලපෑමට ලක් වූ ප්‍රජාවන් සහ අදාළ පාර්ශ්වකරුවන් සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කර එක් එක් දිස්ත්‍රික්කයට උචිත වන පරිදි බහු-ආංශික උපායමාර්ග සහ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි විසඳුම් ක්‍රියාමාර්ග

හදුනාගැනීම සහ ඒවායෙහි ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සකස්කරගැනීම තුළින් ජීවිත, දේපළ, කෘෂි වගාවන්, ජීවනෝපායන් සහ වන සතුන් ආරක්ෂා කර ගැනීම මෙන්ම, අලි-මිනිස් ගැටුම ඵලදායී ලෙස අවම කිරීම සඳහා කටයුතු කළ යුතුය.

5. ඒ සඳහා පහත මූලික ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරමින් අදාළ සැලසුම් සකස් කිරීම සුදුසු බව අවධාරණය කරමි.

5.1 අලි-මිනිස් ගැටුම් අවදානමට ලක්විය හැකි ගම්මාන සහ වඩාත්ම බලපෑමට ලක්විය හැකි පවුල් හඳුනාගැනීම.

5.2 අවදානමට ලක්විය හැකි ප්‍රදේශ ආශ්‍රිතව අවම වශයෙන් පසුගිය වසර 05ක් තුළ වාර්තා වූ ගැටුම් අවස්ථා ආශ්‍රයෙන් වන අලින්ගේ හැසිරීමේ ස්වභාවය පිළිබඳ නිගමනයන්ට එළැඹීම.

5.3 මෙහිදී, එක් එක් වර්ෂයේ වන අලි ගම්වැදීම්, වගා රටාව අනුව සහ වන අලි ප්‍රදේශයෙන් ප්‍රදේශයට සංක්‍රමණය වන කාලසීමාවන් පිළිබඳව මාසිකව තොරතුරු අධ්‍යයනය කිරීම.

5.4 ගැටුම් කළමනාකරණ හා විසඳුම් අධ්‍යයනයේ දී යාබද දිස්ත්‍රික් සඳහා බලපානු ලබන කරුණු මතුවන්නේ නම් ඒකාබද්ධ දිස්ත්‍රික් කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා අවධානය යොමු කිරීම.

5.5 අධ්‍යයනය කරන ලද තොරතුරු පිළිබඳව ගම්වාසීන්ගේ සිට ඉහළ ස්ථර දක්වා අදාළ සියලුම පාර්ශ්ව දැනුවත් කර ගම්මාන අනුව කළමනාකරණ හා විසඳුම් යෝජනා ගොනු කිරීම.

5.6 ඒ අනුව ගැටුම් කලාප, අනතුරු තක්සේරු කිරීම, වන්දි ප්‍රදානය, අධිකරණ තීන්දු ඇතුළු අදාළ දැනුවත් කිරීම් කඩිනමින් සිදුකිරීම සඳහා යෙදවුමක් නිර්මාණය කිරීමේ හැකියාව සොයාබැලීම.

5.7 කඩිනම් ප්‍රතිචාර යාන්ත්‍රණ සඳහා *1992* හදිසි ප්‍රතිචාර අංකය සහ දිස්ත්‍රික්කය තුළ සම්බන්ධ කරගත හැකි අදාළ නිළධාරීන්ගේ දුරකතන අංක පිළිබඳව බලපෑමට ලක්විය හැකි ජනතාව දැනුවත් කිරීම සහ විෂය භාර නිළධාරීන්ගේ කඩිනම් ප්‍රතිචාර පිළිබඳ සහතික කිරීම.

5.8 ප්‍රජා සහභාගීත්වය ඇතිව, පාරිසරික සීමාවන් අනුව අලිවැට ඉදිකළ යුතු ප්‍රදේශ,
අලිවැට ප්‍රතිසංස්කරණය කළ යුතු ප්‍රදේශ නිසි ලෙස හඳුනාගැනීම සහ අවදානමේ ස්වභාවය අනුව ඉදිකිරීම් කාර්යයන් ප්‍රමුඛතාගත කිරීම.

5.9 අලිවැට නඩත්තු කිරීම, ඒ ආශ්‍රිත සෘතුමය පඳුරු ඉවත් කිරීම සහ තාවකාලික බෝග ආරක්ෂණ වැටවල් ඉදිකිරීම සඳහා අදාළ විෂය භාර ආයතන මෙහෙයවීම සහ මේ සඳහා ප්‍රජාවගේ/ සිවිල් ආරක්ෂක භටයන්ගේ සහය ලබා ගැනීම සම්බන්ධ සැලැස්මක් සකස් කිරීම.

5.10 මුරකුටි ඉදිකර රාත්‍රී ආරක්ෂක වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම.

5.11 ඒකාබද්ධ ජංගම මුර සංචාර සිදුකරමින් ජන ජීවිතයට, දේපළට, වගාවන්ට සිදුවන හානි වැළැක්වීම.

5.12 අලි-මිනිස් ගැටුම් පාලනය සඳහා දායක කරගත හැකි ආයතනයන් සඳහා අවශ්‍ය කාර්යමණ්ඩල, රථවාහන සහ තාක්ෂණික උපකරණ පිළිබඳ නිසි තක්සේරුවක් සිදුකර තොරතුරු ලබාගැනීම.

5.13 මෙම කාර්යයන් සඳහා, බලපෑමට ලක් වූ ප්‍රදේශවල ක්‍රියාත්මක වන පෞද්ගලික ආයතනයන්ගෙන් ලබාගත හැකි ස්වේච්ඡා සහය පිළිබඳ හඳුනාගැනීම.

6. ඉහත මූලික ක්‍රියාමාර්ගයන් පිළිබඳව ද අවධානයට ගෙන එක් එක් දිස්ත්‍රික්කය සඳහා හඳුනාගනු ලබන කෙටිකාලීන/ මධ්‍යකාලීන/ දීර්ඝකාලීන කළමනාකරණ හා විසඳුම් යෝජනා ඇතුළත් ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සහ කෙටිකාලීන ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (Implementation Plan) පිළියෙල කර මසක් ඇතුළත (2025.09.01 දිනට පෙර) ජනාධිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (සංවර්ධන පරිපාලන) වෙත ඉදිරිපත් කළ යුතුය.

7. මෙම චක්‍රලේඛය මඟින් අලි-මිනිස් ගැටුම් කළමනාකරණය සඳහා දිස්ත්‍රික් මට්ටමේ කමිටු වහාම ස්ථාපිත කිරීම, සක්‍රීය කිරීම සහ සියලුම රාජ්‍ය සහ පෞද්ගලික පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණයෙන් ඉහත ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරන අතර, ජනතාව සහ වන අලින් යන දෙපාර්ශ්වයේම ආරක්ෂාව සහතික කිරීම සහ ශ්‍රී ලංකාවේ පාරිසරික හා ජෛව විවිධත්ව උරුමය ආරක්ෂා කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම අත්‍යාවශ්‍ය බව අවධාරණය කරමි.

8. මෙම කාර්යයන් සිදුකිරීමේදී රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියා කළ යුතු බව කාරුණිකව දන්වමි.

**ආචාර්ය එන් එස් කුමානායක**
ජනාධිපති ලේකම්

පිටපත්:

1. ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
2. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
3. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
5. ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
6. ලේකම්, පරිසර අමාත්‍යාංශය
7. ප්‍රධාන ලේකම් - උතුරු උතුරු මැද, නැගෙනහිර, වයඹ, දකුණු, ඌව, මධ්‍යම